කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

බාහිර විභාග අංශය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2010

2011 අප්‍රේල් / මැයි

මානවශාස්ත්‍ර පීඨය

සිංහල - SINH E1015

නාට්‍ය කලාව, නූතන සිංහල කාව්‍ය හා ප්‍රබන්ධ කථා

**පළමුවන ප්‍රශ්නය ද, දෙවන තෙවන කොටස්වලින් ප්‍රශ්න දෙක (02) බැගින් ද තෝරාගෙන ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.**

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

## 1 කොටස

01. පහත සඳහන් පද්‍ය රචනය රසාස්වාදය කරන්න.

රන් එළියට හැන්දෑවේ මුදු කෙහෙ දිලිසෙන්නේ
රන් ගෝමර පෙති ඉහිලා ළමැද බබුළුවන්නේ
රන් වන් වී කරලක් මෙන් බිමට නැමී ඉන්නේ
රන් එතනා ඉපනැල්ලේ මොනවද අහුලන්නේ

උදේ ඉදන් වැඩ කරලා දනුයි ගොඩට එන්නේ
වෙලේ තමයි ජීවිතයම අවුවට කර වෙන්නේ
උඹේ කැකිරි සිනා පොදක් මා වෙත හෙලමින්නේ
හිතේ තියෙන දුක මඳකට දුරු කරවාපන්නේ

මාස ගණන් වැස්ස නැතිව දිගටම පායන්නේ
වේලි ලියදි දිය හිඳිලා ඉරි තැලිලා යන්නේ
වේලුණු බිම ගිනියම් වී අවුව කැකෑරෙන්නේ
පාළු කුඹුර ගැන සිහි වන කලට පපුව දන්නේ

බැන්ද වරල පීරා ගෙන හෙමින් සැරේ එන්නේ
හැන්දෑවේ සිහිල් සුළඟ ඇඟ වට නලියන්නේ
අන්දකාර දුරු කරවන මැණික් පාන වැන්නේ
කින්ද පාළු කුඹුරේ තව තනියම පසු වන්නේ

කාලෙට මහ වැහි වැහැලා සාගත දුරු වෙන්ටයි
වේලි, ලියදි, ගං, ඇල, දොල පිරී ගලා යන්ටයි
වියළුණු වැලි බිම තෙත් වී නැවුම් සුවඳ එන්ටයි
සාරව මුළු පොළොව එයින් ජීවය උතුරන්ටයි

ළා ගොයමේ නිල්ල ඇවිත් පොළොව වසා ගන්ටයි
හිනා කිරෙන් කිරි වැදිලා කරලින් බර වෙන්ටයි
ඇගේ පාට රන් කරලෙත් අස්වනු පිදෙන්ටයි
හිතේ සියලු දුක් කරදර අමතක කර ලන්ටයි

රන් එළියට හැන්දෑවේ මුදු කෙහෙ දිලිසෙන්නේ
රන් ගෝමර පෙති ඉහිලා ළමැද බබුළුවන්නේ
රන් පාටට එකතු වෙලා අඳුර ගලා එන්නේ
කින් ද පාළු කුඹුරේ තව තනියම පසු වන්නේ

<u>2 කොටස</u>

02. ජාතික ව්‍යාපාරයේ අරමුණු අන්තර්ගත වූ පද්‍ය කාව්‍යයන්හි කලාත්මක අගය කෙබඳු ද' යි නිදර්ශනාශ්‍රයෙන් පරීක්ෂා කරන්න.

03. නවසියහැත්තෑව වර්ෂයෙන් ආරම්භ වන දශකයට අයත් කවීන් සමාජීය ප්‍රස්තුතයන් ප්‍රතිනිර්මාණයෙහි පළ කළ කුසලතා සහ දුබලතා නිරීක්ෂණය කරන්න.

**නැතහොත්,**

පහත සඳහන් කවීන් අතරින් <u>එක්</u> අයකුගේ අනන්‍යතාව උදාහරණ සහිතව පිරික්සන්න.

- අ) ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ
- ආ) ජී. බී. සේනානායක
- ඇ) ආරියවංශ රණවීර

04. අවශේෂ සාහිත්‍යාංග සමඟ සසඳමින් නාට්‍ය කලාවේ විශේෂත්වය පැහැදිලි කරන්න.

**නැතහොත්,**

නාට්‍යෝචිත අවස්ථාව යනුවෙන් කුමක් අදහස් කෙරේ දැ' යි නිදර්ශනාත්මකව විග්‍රහ කරන්න.

05. ''<u>රත්නාවලී</u> නාට්‍යයේ මුඛ්‍ය රසය හාස්‍යය යි.'' මේ ප්‍රකාශයට එකඟ විය හැකි දැ' යි විමසන්න.

<u>3 කොටස</u>

06. මෙරට ග්‍රාමීය ජීවිතය යථාර්ථවාදීව නිරූපණය කිරීමට කෙටිකතා රචකයන් දක්වා ඇති සාමර්ථ්‍යය කෙබඳු දැ' යි නිදසුන් සහිතව පිරික්සන්න.

**නැතහොත්,**

පහත සඳහන් ලේඛකයන් අතරින් <u>එක්</u> අයකුගේ කෙටිකතා පිළිබඳ අගැයීමක් කරන්න.

- අ) සෝමරත්න බාලසූරිය
- ආ) රංජිත් ධර්මකීර්ති
- ඇ) දයාසේන ගුණසිංහ

07. මාර්ටින් වික්‍රමසිංහ, ශ්‍රී ලංකාවේ සිදු වූ සමාජ පරිවර්තනය ගැඹුරින් ග්‍රහණය කිරීමට සමත් වී දැ' යි තුන්ඈඳුතු නවකතා ආශ්‍රයෙන් විභාග කරන්න.

**නැතහොත්,**

<u>විරාගය</u> පසුකාලීන නවකතා රචකයන් කෙරෙහි බලපෑ ආකාරය විචාරාත්මකව පැහැදිලි කරන්න.

08. ''<u>තෘෂ්ණාහරණ</u> වනාහි ප්‍රභූ පන්තිය නිර්දය උපහාසයට පාත්‍ර කරන නවකතාවකි.'' මේ ප්‍රකාශය යුක්තියුක්ත දැ' යි විමසන්න.

*****************************